මගේ අංකය : S-1/25/PSC/2016(III)
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

2016 නොවැම්බර් 10 දින

සියලුම අංශ ප්‍රධානීන් වෙත

**විගණන පරීක්ෂක සේවය II ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්, විගණන පරීක්ෂක සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම**

විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විගණන පරීක්ෂක සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් විගණන පරීක්ෂක සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් වන 6 (i) ඡේදය සංශෝධනය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

02. එම සංශෝධනයට අනුව පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති විගණන පරීක්ෂක සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් හට විගණන පරීක්ෂක සේවයේ I ශ්‍රේණියට උසස්වීම සඳහා අයදුම් කළ හැක.

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයා ගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

3. ඒ අනුව, මේ සම්බන්ධව ඔබ යටතේ සේවය කරන විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන්ට ඇමුණුම 01 හි පවතින නියමිත ආකෘතිය පුරවා ඔබ මගින් මා වෙත යොමු කිරීමට උපදෙස් ලබා දෙන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

එම්. එස්. කපුකොටුව
අධ්‍යක්ෂ (පාලන)
විගණකාධිපති වෙනුවට

එම්. එස්. කපුකොටුව
ශ්‍රී. ලං. ප. සේ. I
අධ්‍යක්ෂ (පාලන)
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.